(අටවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

**අංක 102.]**

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2019 නොවැම්බර් 07 වැනි බ්‍රහස්පතින්දා පූ.භා. 10.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා**, කථානායකතුමා

ගරු **ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **හරින් ප්‍රනාන්දු මහතා,** විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **අර්ජුන රණතුංග මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **අජිත් පී. පෙරේරා මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන විශේෂ ප්‍රදේශ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ලකී ජයවර්ධන මහතා,** නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා,** ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉරාන් වික්‍රමරත්න මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එඩ්වඩ් ගුණසේකර මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා**

ගරු **ලසන්ත අලගියවන්න මහතා**

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා

ගරු එස්. බී. නාවින්න මහතා

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා

ගරු බිමල් රත්නායක මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා

ගරු නිමල් ලාන්සා මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු විදුර වික්‍රමනායක මහතා

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු ඩුලිප් විජේසේකර මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු චන්දිම වීරක්කොඩි මහතා

ගරු එස්. ශ්‍රීතරන් මහතා

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය

ගරු මහින්ද සමරසිංහ මහතා

ගරු සන්දිත් සමරසිංහ මහතා

**ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**

**ගරු මුත්තු සිවලිංගම් මහතා**

**ගරු අන්නාමලෙයි නඩේසු සිවශක්ති මහතා**

**ගරු තිලංග සුමතිපාල මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා**

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**

**ගරු ඩී. බී. හේරත් මහතා**

**ගරු මනෝජ් හේවාගම්පලගේ මහතා**

**ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන** : කථානායකවරයා විසින් මතු පළ වන නිවේදනය කරන ලදී:—

**I**

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව, 2019 ඔක්තෝබර් 31 දින 'සුරාබදු (සංශෝධන)', 'එකතු කළ අගය මත බදු (සංශෝධන)', 'ජාතිය ගොඩනැඟීමේ බදු (සංශෝධන)' සහ 'මුදල්' නමැති පනත් කෙටුම්පත්වල ම'විසින් සහතිකය සටහන් කරන ලද බව දැනුම් දීමට කැමැත්තෙමි."

**II**

" 'ශ්‍රී ශාක්‍යසිංහාරාම විහාරස්ථ කාර්යය සාධක සංවිධානය (සංස්ථාගත කිරීමේ)' නමැති පනත් කෙටුම්පත සලකා බැලීම පිණිස පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 113(2) ප්‍රකාරව, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට මතු පළ වන මන්ත්‍රීවරයන් අතිරේක සාමාජිකයන් වශයෙන් ම'විසින් නම් කරන ලද බව දැනුම් දීමට කැමැත්තෙමි:—

ගරු ටී. බී. ඒකනායක මහතා

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

ගරු තිලංග සුමතිපාල මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු හේෂා විතානගේ මහතා.''

**III**

''2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 35(1) වගන්තිය ප්‍රකාරව, විගණකාධිපතිවරයා විසින් ම'වෙත ඉදිරිපත් කරන ලද 2020 වර්ෂය සඳහා ජාතික විගණන කාර්යාලයේ වාර්ෂික කාර්ය වැඩසටහන් කෙටුම්පත එකී පනතේ 35(2) වගන්තිය ප්‍රකාරව, සමාලෝචනයට ලක් කිරීම සඳහා රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරනු ලබන බව දැනුම් දීමට කැමැත්තෙමි.''

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) කථානායකවරයා විසින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව, 2018 වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්ෂික වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි ද, මුද්‍රණය කළ යුතු යැයිද නියෝග කරන ලදී.

(2) කථානායකවරයා විසින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව—

(i) 2016 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ හයවැනි කාණ්ඩයේ XXIII කොටස;

(ii) 2017 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ XXVIII කොටස, සිව්වැනි කාණ්ඩයේ VII හා VIII කොටස් සහ හයවැනි කාණ්ඩයේ XIII, XIV, XV, XVI, XVII, XVIII හා XIX කොටස්;

(iii) 2018 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ II, III, IV, V, VI, VII හා VIII කොටස්, දෙවැනි කාණ්ඩයේ III හා IV කොටස්, පස්වැනි කාණ්ඩයේ II කොටස, හයවැනි කාණ්ඩයේ I කොටස සහ අටවැනි කාණ්ඩයේ III කොටස; සහ

(iv) 2019 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ අටවැනි කාණ්ඩයේ I කොටස සහ දසවැනි කාණ්ඩයේ XII කොටස

පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි ද, මුද්‍රණය කළ යුතු යැයිද නියෝග කරන ලදී.

(3) කථානායකවරයා විසින්—

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2019 වර්ෂයේ දෙවැනි කාර්තුව (2019.04.01 – 2019.06.30) සඳහා මුදල් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව;

(ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2019 වර්ෂයේ දෙවැනි කාර්තුව (2019.04.01 – 2019.06.30) සඳහා සීමානිර්ණය කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව;

(iii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ(6) සහ 153ඌ ව්‍යවස්ථා ප්‍රකාරව 2019 වර්ෂයේ දෙවැනි කාර්තුව සඳහා (2019.04.01 - 2019.06.30) විගණන සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව; සහ

(iv) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ (6) සහ 55(5) ව්‍යවස්ථා ප්‍රකාරව 2019 වර්ෂයේ දෙවැනි කාර්තුව සඳහා (2019.04.01 - 2019.06.30) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ප්‍රගති වාර්තාව

පිළිගන්වන ලදී.

එකී යන ලද වාර්තා **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(4) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156ඇ(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් සකස් කරන ලදුව, 2019 ඔක්තෝබර් 12 දිනැති අංක 2144/68 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ – 2019 පිළිගන්වා, එම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්—

(i) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2019.06.21 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අටවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරයේ තෙවැනි වාර්තාවේ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ 2017 වර්ෂයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් සඳහන් කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව;

(ii) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2019.06.21 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අටවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරයේ තෙවැනි වාර්තාවේ විගණන සේවා කොමිෂන් සභාවේ 2017 වර්ෂයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් සඳහන් කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව; සහ

(iii) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2019.06.21 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අටවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරයේ තෙවැනි වාර්තාවේ පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) කාර්යාලයේ 2017 වර්ෂයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් සඳහන් කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව

පිළිගන්වා, එම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2017 වර්ෂය සඳහා උද්භිද උද්‍යාන භාර අරමුදලේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව තිරසර සංවර්ධනය හා පරිසරය සහ ස්වභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2019.06.21 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අටවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරයේ තෙවැනි වාර්තාවේ තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ සහ ජාතික උද්භිද උද්‍යා න දෙපාර්තමේන්තුවේ 2017 වර්ෂයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් සඳහන් කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව පිළිගන්වා, එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(8) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්—

(i) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ජූලි 10 දිනැති අංක 2131/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(ii) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 අගෝස්තු 09 දිනැති අංක 2135/55 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iii) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 අගෝස්තු 10 දිනැති අංක 2135/68 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iv) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 අගෝස්තු 01 දිනැති අංක 2134/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(v) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 අගෝස්තු 08 දිනැති අංක 2135/54 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(vi) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 අගෝස්තු 10 දිනැති අංක 2135/67 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(vii) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 සැප්තැම්බර් 07 දිනැති අංක 2139/74 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(viii) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 සැප්තැම්බර් 10 දිනැති අංක 2140/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(ix) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 සැප්තැම්බර් 30 දිනැති අංක 2143/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(x) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ඔක්තෝබර් 02 දිනැති අංක 2143/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(xi) 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වගන්තිය සමග කියවිය යුතු 29 වගන්තිය යටතේ බලයලත් වෙළඳුන් විසින් සිදු කරනු ලබන විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු වර්ග සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ඔක්තෝබර් 17 දිනැති අංක 2145/49 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(xii) (235 අධිකාරය) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් වූ යෝජනාව
(2019 සැප්තැම්බර් 10 දිනැති අංක 2140/19 දරන අති විශේෂ ගැසට් පත්‍රය); සහ

(xiii) (235 අධිකාරය) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් වූ යෝජනාව
(2019 සැප්තැම්බර් 27 දිනැති අංක 2142/87 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

පිළිගන්වා, එම නියමයන්, නියෝග සහ යෝජනාවන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(9) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2018.02.23 සිට 2018.10.12 දක්වා කාලයට අදාළව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2019.04.04 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අටවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරයේ දෙවැනි වාර්තාවේ මුදල් අමාත්‍යාංශය සම්බන්ධයෙන් සඳහන් කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව පිළිගන්වා, එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(10) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්—

(i) 2018 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යායතනයේ වාර්ෂික වාර්තාව;

(ii) 2018 වර්ෂය සඳහා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(iii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20(4)(ආ) වගන්තිය යටතේ යාපනය විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙනුවට 2019.05.07 දින සිට බලපැවැත්වෙන පරිදි නිසි බලධරයා ලෙස සම්මානණීය මහාචාර්ය කන්දසාමි කදිරගාමනාදන් මහතා පත් කිරීම සම්බන්ධයෙන් නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 මැයි 07 දිනැති අංක 2122/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iv) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20(4)(ආ) වගන්තිය යටතේ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ අධ්‍යක්ෂ වෙනුවට 2019.05.01 දින සිට බලපැවැත්වෙන පරිදි නිසි බලධරයා ලෙස මේජර් ජනරාල් (විශ්‍රාමික) හේරත් මුදියන්සේලාගේ උදය බණ්ඩාර හේරත් මහතා පත් කිරීම සම්බන්ධයෙන් නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 මැයි 08 දිනැති අංක 2122/26 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(v) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20(4)(ආ) වගන්තිය යටතේ මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂ වෙනුවට 2019.05.15 දින සිට බලපැවැත්වෙන පරිදි නිසි බලධරයා ලෙස මේජර් ජනරාල් (විශ්‍රාමික) ශාන්ත කුමාර් තිරුණාවුකරසු මහතා පත් කිරීම සම්බන්ධයෙන් නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 මැයි 14 දිනැති අංක 2123/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය

පිළිගන්වා, එම වාර්තා සහ නියමයන් අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(11) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2015 සහ 2016 වර්ෂ සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ වාර්ෂික වාර්තා සහ ගිණුම් පිළිගන්වා, එම වාර්තා අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(12) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2019.06.21 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අටවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරයේ තෙවැනි වාර්තාවේ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ, කොළඹ, රත්නපුර, පුත්තලම, නුවරඑළිය, කුරුණෑගල, මඩකලපුව, බදුල්ල, මාතර, මොනරාගල, කළුතර, මුලතිව්, කිලිනොච්චි, වවුනියා, යාපනය, ගාල්ල, මහනුවර, මාතලේ, අනුරාධපුර, පොළොන්නරුව සහ මන්නාරම යන දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල 2017 වර්ෂයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් සඳහන් කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා පිළිගන්වා, එම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(13) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2017.07.01 සිට 2017.09.30 දක්වා කාලයට අදාළව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් 2019.01.24 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අටවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරයේ පළමුවැනි වාර්තාවේ ශ්‍රී ලංකා ඖෂධ නීතිගත සංස්ථාව සහ ශ්‍රී ලංකා ඖෂධ නිෂ්පාදන සංස්ථාව සම්බන්ධයෙන් සඳහන් කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව පිළිගන්වා, එම වාර්තාව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(14) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්—

(i) 2016 වර්ෂය සඳහා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2018 වර්ෂය සඳහා පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව

පිළිගන්වා, එම වාර්තා නිෂ්පාදන හා සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(15) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2019.06.21 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අටවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරයේ තෙවැනි වාර්තාවේ කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ සහ වාණිජ දෙපාර්තමේන්තුවේ 2017 වර්ෂයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් සඳහන් කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා පිළිගන්වා, එම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(16) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2017 වර්ෂය සඳහා පොල් සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(17) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්—

(i) 2017 වර්ෂය සඳහා පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2017 වර්ෂය සඳහා සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ වාර්ෂික වාර්තාව

පිළිගන්වා, එම වාර්තා කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(18) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2019.06.21 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අටවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරයේ තෙවැනි වාර්තාවේ මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ 2017 වර්ෂයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් සඳහන් කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව පිළිගන්වා, එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(19) ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින්, 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 66 සහ 69 වගන්ති සමඟ කියවිය යුතු එකී පනතේ 117 වගන්තිය යටතේ සේවක පිරිස් සහ පුහුණු කිරීමේ ආයතන සඳහා බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජූලි 03 දිනැති අංක 2078/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග පිළිගන්වා, එම නියෝග ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(20) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2019.06.21 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අටවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරයේ තෙවැනි වාර්තාවේ අධ්‍යාපන අමාත්‍යාංශයේ 2017 වර්ෂයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් සඳහන් කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව පිළිගන්වා, එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(21) විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යවරයා විසින්, 2017.07.01 සිට 2017.09.30 දක්වා කාලයට අදාළව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් 2019.01.24 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අටවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරයේ පළමුවැනි වාර්තාවේ ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී සම්බන්ධයෙන් සඳහන් කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව පිළිගන්වා, එම වාර්තාව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(22) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2017 වර්ෂය සඳහා වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව සෞඛ්‍ය හා මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(23) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 1985 අංක 48 දරන හා 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(3) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු එකී පනතේ 20 වගන්තිය යටතේ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ඔක්තෝබර් 22 දිනැති අංක 2146/23 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් මුද්‍රණ දෝෂ සංශෝධනය කරන ලද 2019 ඔක්තෝබර් 03 දිනැති අංක 2143/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග පිළිගන්වා, එම නියෝග ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(24) අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ අමාත්‍යවරයා විසින්—

(i) 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 8(2) වගන්තිය සමඟ කියවිය යුතු 24 වගන්තිය යටතේ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත ඉ-ජනගහන රෙජිස්ටර සම්බන්ධයෙන් විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 මැයි 29 දිනැති අංක 1864/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(ii) 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 8(2) වගන්තිය සමග කියවිය යුතු 24 වගන්තිය යටතේ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත ඉ-ජනගහන රෙජිස්ටර සම්බන්ධයෙන් ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 මාර්තු 14 දිනැති අංක 2114/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග; සහ

(iii) 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 8(2) වගන්තිය සමග කියවිය යුතු 24 වගන්තිය යටතේ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත ඊ-පුද්ගලයන් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 මාර්තු 21 දිනැති අංක 2115/42 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග

පිළිගන්වා, එම නියෝග ප්‍රවාහනය සහ සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(25) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2018 වර්ෂය සඳහා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52(6) යටතේ වාර්තා පිළිගැන්වීම :** (1) "සමාගම් (සංශෝධන) පනත් කෙටුම්පත" නමැති කෙටුම්පත පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52(6) යටතේ කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යවරයාගේ වාර්තාව රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලදී.

පනත් කෙටුම්පත 2019 දෙසැම්බර් 03 වැනි අඟහරුවාදා දෙවැනි වර කියවිය යුතුයැයි නියෝග කරන ලදී.

(2) "මරණ දණ්ඩනය අහෝසි කිරීමේ" නමැති පනත් කෙටුම්පත පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52(6) යටතේ අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යවරියගේ වාර්තාව රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලදී.

පනත් කෙටුම්පත 2019 දෙසැම්බර් 03 වැනි අඟහරුවාදා දෙවැනි වර කියවිය යුතුයැයි නියෝග කරන ලදී.

**4. කාරක සභා වාර්තා පිළිගැන්වීම :** (1) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා විසින්, අටවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරය සඳහා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සිව්වැනි වාර්තාව වශයෙන් 2017.03.17 සිට 2018.04.04 දක්වා එම කාරක සභාවේ විමර්ශනයට ලක් වූ මෙරට රාජ්‍ය විශ්වවිද්‍යාල හා එයට සමගාමීව ක්‍රියාත්මක වන උසස් අධ්‍යාපන ආයතන සම්බන්ධයෙන් වූ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි ද, මුද්‍රණය කළ යුතු යැයිද නියෝග කරන ලදී.

(2) තිරසර සංවර්ධන සහ පරිසර හා ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය වෙනුවෙන් එහි සාමාජික මන්ත්‍රී ගරු සන්දිත් සමරසිංහ මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද "(469 අධිකාරය) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමයන්" සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(3) තරුණ, ක්‍රීඩා, කලා සහ උරුමයන් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු සී. බී. රත්නායක මහතා වෙනුවෙන් එහි සාමාජික මන්ත්‍රී ගරු කේ. කේ. පියදාස මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද "ක්‍රීඩාවලට සම්බන්ධ වැරදි වැළැක්වීමේ පනත් කෙටුම්පත" සහ "1973 අංක 25 දරන ක්‍රීඩා පනත" යටතේ නියෝග සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(4) නිෂ්පාදන හා සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු සුජිත් සංජය පෙරේරා මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) 2016 හා 2017 වර්ෂ සඳහා ජාතික ශිල්ප සභාවේ වාර්ෂික වාර්තා;

(ii) 2014 සහ 2015 වර්ෂ සඳහා ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තා හා ගිණුම් ප්‍රකාශන;

(iii) 2014/2015 වර්ෂය සඳහා කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්හි වාර්ෂික වාර්තාව;

(iv) 2017 වර්ෂය සඳහා පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(v) 2013 වර්ෂය සඳහා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව;

(vi) 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනයේ වාර්ෂික වාර්තාව;

(vii) 2013 වර්ෂය සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලයේ වාර්ෂිකව වාර්තාව; සහ

(viii) 2014, 2015, 2016 සහ 2017 වර්ෂ සඳහා ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ්හි වාර්ෂික වාර්තා

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(5) අධ්‍යාපනය සහ මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) 2014 හා 2015 වර්ෂ සඳහා වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තා;

(ii) 2016 වර්ෂය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(iii) 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(iv) 2016 වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව;

(v) 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(vi) 2016 වර්ෂය සඳහා යාපනය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(vii) 2017 වර්ෂය සඳහා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(viii) 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(ix) 2017 වර්ෂය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව;

(x) 2017 වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(xi) 2017 වර්ෂය සඳහා වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව;

(xii) 2017 වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව;

(xiii) 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා භික්ෂු විශ්ව විද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(xiv) 2017 වර්ෂය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව;

(xv) 2017 වර්ෂය සඳහා මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනයේ වාර්ෂික වාර්තාව හා වාර්ෂික ගිණුම්;

(xvi) 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(xvii) 2017 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(xviii) 2017 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ වාර්ෂික වාර්තාව;

(xix) 2017 වර්ෂය සඳහා රුහුණ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(xx) 2017 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛවතාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව;

(xxi) 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(xxii) 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(xxiii) 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(xxiv) 2017 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ වාර්ෂික වාර්තාව;

(xxv) 2017 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ වාර්ෂික වාර්තාව;

(xxvi) 2017 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(xxvii) 2017 වර්ෂය සඳහා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(xxviii) 2017 වර්ෂය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(xxix) 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්; සහ

(xxx) 2017 වර්ෂය සඳහා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ස්වාමි විපුලානන්ද සෞන්දර්ය ආයතනයේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(6) ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ සභාපති ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා විසින්, ''ඌව පළාත් සංචාරක සංවර්ධන කාර්යාංශය'' නමැති ප්‍රඥප්ති කෙටුම්පත පිළිබඳව එම කාරක සභාවේ වාර්තාව සහ එහි කාර්ය සටහන් පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

**5. ඌව පළාත් සංචාරක සංවර්ධන කාර්යාංශය නමැති ප්‍රඥප්ති කෙටුම්පත පිළිබඳ ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ වාර්තාව**: ව්‍යවස්ථාදායක කාරක සභාවේ සභාපති ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා ඉදිරිපත් කළ යෝජනාව, — අද දින ඉදිරිපත් කරන ලද ඌව පළාත් සංචාරක සංවර්ධන කාර්යාංශය නමැති ප්‍රඥප්ති කෙටුම්පත පිළිබඳ ව්‍යවස්ථාදායක කාරක සභාවේ වාර්තාව පිළිගත යුතුය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 51.(3) (ආ) යටතේ ප්‍රඥප්ති කෙටුම්පත පිළිබඳ පාර්ලිමේන්තුවේ අදහස් ඉදිරිපත් කරන ලෙස පාර්ලිමේන්තුව විසින් මහලේකම්වරයාට නියෝග කරන ලදී.

**6. මහජන පෙත්සම් පිළිගැන්වීම :**

නාත්තන්ඩිය, මාරවිල පාර, නවෝදය මාවත, අංක 182 දරන ස්ථානයෙහි පදිංචි ඒ. එම්. ඩී. එස්. සී. අලහකෝන් මහතා ඇතුළු එකොළොස් දෙනෙකුගෙන් ලැබුණු 2019.08.19 දිනැති පෙත්සම ගරු ගාමිණී ලොකුගේ මහතා විසින් පිළිගන්වන ලදී.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 30(10) යටතේ එම පෙත්සම, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**7. ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන) :** අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා වෙනුවෙන් ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා පිළිගන්වන ලද පනත් කෙටුම්පත,— (122 අධිකාරය වූ) ඇටෝර්නි බලපත්‍ර ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2019 දෙසැම්බර් 03 වැනි අඟහරුවාදා දෙවැනි වර කියවිය යුතුයැයි ද, එය මුද්‍රණය කළ යුතුයැයි ද, එම පනත් කෙටුම්පත අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමුකළ යුතුයැයිද නියෝග කරන ලදී.

**8. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1) :** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 10.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.30 සිට අ.භා. 6.30 දක්වා ද විය යුතු ය. අ.භා. 1.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 6.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**9. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2) :** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2019 දෙසැම්බර් 03 වැනි අඟහරුවාදා අ.භා. 1.00 වනතෙක් කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**10. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 1) :** ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා, ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"1999 අංක 8 දරන දුම්කොළ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52(6) යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා වෙත පවරන ලදී.

**11. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 2) :** ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා, ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"1988 අංක 2 දරන පළාත් සභා මැතිවරණ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52(6) යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා වෙත පවරන ලදී.

**12. ක්‍රීඩා පනත යටතේ නියෝග (අංක 1) :** විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වගන්තිය සමඟ කියවිය යුතු 41 වගන්තිය යටතේ ජාතික ක්‍රීඩා සංගම් සම්බන්ධයෙන් විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ජූනි 18 දිනැති අංක 2128/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.10.08 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අ. භා. 1.30 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**13. ක්‍රීඩා පනත යටතේ නියෝග (අංක 2) :** විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වගන්තිය සමඟ කියවිය යුතු 41 වගන්තිය යටතේ ජාතික ක්‍රීඩා සංගම් සම්බන්ධයෙන් විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 අගෝස්තු 23 දිනැති අංක 2137/85 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.10.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**14. ක්‍රීඩා පනත යටතේ නියෝග (අංක 3) :** විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වගන්තිය සමඟ කියවිය යුතු 41 වගන්තිය යටතේ ජාතික ක්‍රීඩා සංගම් සම්බන්ධයෙන් විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 අගෝස්තු 23 දිනැති අංක 2137/86 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.10.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**15. ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත** : සලකා බැලීම පිණිස නියෝගය කියවන ලදී.

පනත් කෙටුම්පත ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේදී සංශෝධනය වූ ආකාරයෙන් සලකා බලන ලදී.

"ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ සංශෝධන පිළිගත යුතුය"යි ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වැනි වර කියවිය යුතුය"යි ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් ඊට අනුකූලව තුන්වැනි වර කියවා සම්මත කරන ලදී.

**16. ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත** : දෙවැනි වර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතුය"යි ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනිවර කියවන ලදින්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 53(3) යටතේ නියෝජ්‍ය කථානායකවරයා විසින් ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට පවරන ලදී.

(අ. භා. 2.06 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

**17. කල් තැබීම (ජාතීන් සහ ආගම් අතර සමඟිය සඳහා නීති සම්පාදනය)** : "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ.භා. 4.01 ට, අද දින සභා සම්මතිය අනුව 2019 දෙසැම්බර් 03 වැනි අඟහරුවාදා අ.භා. 1.00 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.